*Vidyodaya J. Soc. Sc., Vol. 7 1 & 2 1996, pp. 87 - 95*

# වව්නියාව කෞතුකාගාරයේ ඇති දුර්ලභ හිරිගල් කලා කෘති කීපයක්

**හබරකඩ වජිර හිමි**

පැරණි ශ්‍රී ලංකා මූර්ති ශිල්පීහු මූර්ති හා සැරසිලි නිර්මාණ කරණයේදී තමා අවට පරිසරයෙන් සොයා ගත හැකි වූ විවිධ අමුද්‍රව්‍ය උපයෝගී කොට ගත්හ. ලී, මැටි, හුණුබදාම, ඇත්දළ, ලෝහ වර්ග හා ගල් මේ අතරින් ප්‍රධාන තැනක් ගනී.(1) සෑම කාලයේදීම පහසුවෙන් පරිසරයෙන් සොයා ගත හැකි වූ අමුද්‍රව්‍යයක් වූ ලී නිර්මාණ කාර්යයන් සඳහා යොදා ගත්තද කාලය විසින් ඒවා බෙහෙවින් දිරාපත් කොට ඇත. ක්‍රි. ව. 8-10 සියවස් අතරට අයත් යැයි අනුමාන කෙරෙන බුදු පිළිමයක් ඇතුළු දැව මූර්ති කීපයක්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොළඹගම රජමහා විහාරය, නිකවකන්ද, හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ රිටිගලින් සොයා ගෙන ඇත.(2) අනුරාධපුර යුගයේදී කරන ලද මැටි මූර්ති සැලකිය යුතු ප්‍රමාණයක් අපට රාජාන්ගනය, සෝමාවතිය, මිහින්තලය, සීගිරිය, මැණික්දෙන, රජගල ආදී ස්ථානවලින් හමු වී ඇත.(3) මැටියෙන් වැඩිපුරම සකසා ඇත්තේ වාමන හා වෙනත් සැරසිලි අංගයන්ය. අලංකාර කාන්තා රූප(4) හා කුළුණු හිස් සීගිරියෙන් හමු වී ඇත. මේ යුගයේදී මැටියෙන් කළ බුද්ධ ප්‍රතිමා හමුවන්නේ ඉතා විරල වශයෙනි. මධ්‍යම ප්‍රමාණයේ බුදුපිළිම දෙකක කැඩී ගිය කොටස් රුහුණෙහි මහුල් මහා විහාරයෙන් සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගල්ඇන්ද පුරාණ විහාරයෙන් ලැබී ඇත.(5) මැටි බුදු පිළිම මෙසේ දුර්ලභ වන්නට ඇත්තේ ඒවා සකසා ගින්නෙහිලා පිළිස්සීමට ශ්‍රද්ධාවන්ත ශිල්පීහු අකමැත්තක් දැක්වූ නිසා වීමට පුළුවන.

හුණු බදාමයෙන් කරන ලද මූර්ති අනුරපුර යුගයේදී ව්‍යාප්ත වී ගිය අතර එය වඩා දියුණු වූයේ පොළොන්නරු යුගයේදී ය. පොළොන්නරුවේ ථූපාරාම, ලංකාතිලක, තිවංක පිළිම ගෙය ආදී ස්ථානයන්හි පිට බිත්ති මත විවිධ ප්‍රමාණයේ හුණු බදාම ප්‍රතිමා විශාල වශයෙන් දැක ගත හැකිය. ලෝහ වර්ග අතුරින් නිර්මාණ කරණය සඳහා රන්, රිදී, ලෝකඩ වැනි ද්‍රව්‍ය භාවිතා කළහ. මේ අතුරින් වඩාත් භාවිතයට ගෙන ඇත්තේ ලෝකඩය. රන් භාවිත කොට ඒකඝනව සැකසූ ප්‍රතිමා විරල ය. රන් තහඩු වලින් ප්‍රතිමා සකසා ඒ තුළට කිසියම් බදාම වර්ගයක් පිරවීම අනුරපුර මෙන්ම පොළොන්නරු යුගයේ කලා කරුවන්ගේ නිර්මාණ ක්‍රමය වී තිබිණි. මෙබඳු බුද්ධ ප්‍රතිමා මිහින්තලය(6), දැදිගම, තිස්සමහාරාමය, පඬුවස්නුවර ආදි ස්ථාන වලින් ලැබී ඇත.(7) පැරණි ශිලිපීහු තවත් කැමැත්තක් දැක් වූ නිමීණ ක්‍රමයක් වූයේ ලෝකඩින් ප්‍රතිමාවක් හෝ වෙනත් කලා කෘතියක් නිමවා ඒවා රනින් ආලේප කිරිමයි. ත්‍රිකුණාමලයට ආසන්නයෙන් හමුව දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙහි ඇති විශාල තාරා ප්‍රතිමාව (8), වෙහෙරගල අවලෝකිතේශ්වර බෝසත් ප්‍රතිමාව (9) හා බුද්ධ ප්‍රතිමාව (10) ඒවායෙන් මුල්තැනක් ගනී. අභයගිරි කලාකරුවාද මේ සඳහා වැඩි කැමැත්තක් දැක් වූ බව මෑත කැනීම් වලින් ලද ලෝකඩ ප්‍රතිමා බොහොමයකින් පැහැදිළි විය.

ඓතිහාසික යුගවල නිර්මාණ කරණයේදී බහුලවම උපයෝගී කොටගත් නිමි ද්‍රව්‍යය වූයේ විවිධ පාෂාණ වර්ගයන් ය. අඟල් කීපයක් උස කුඩා ප්‍රතිමාවල සිට අඩි 40-50 තරම් වූ අතිවිශාල ප්‍රමාණයේ ප්‍රතිමා නිර්මාණය සඳහා පවා පාෂාණ භාවිතා කළහ. එසේම කුඩා ප්‍රමාණයේ ගොඩනැගිලිවල සිට ලෝවාමහාප්‍රසාදය වැනි අතිවිශාල වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් සඳහා ද ගල් භාවිතයට ගැනුණි. මෙසේ විවිධ නිර්මාණ කාර්යයන් සඳහා සම්භාවිත පාෂාණ වර්ග ඒවායේ අඩංගු සංයුතිය අනුව වර්ග කීපයකට බෙදනු ලැබ ඇත.

1. ස්ඵටික හුණුගල්
2. ග්‍රැනයිට්
3. නයිස්
4. හිරිගල් (කොරල්)

මේ හැරුණු විට කොණ්ඩලයිට්, වැලිගල් ආදී වර්ග ඒ අතර වේ.

මේවායින් වැඩිපුරම නිර්මාණ කාර්ය සඳහා භාවිතයට ගෙන ඇත්තේ මුලින් සඳහන්ව ඇති පාෂාණ විශේෂයන් තුනය. එහි ඇති පළමු වර්ගය වන ස්ඵටික හුණුගල් මුල්කාලීන වාහල්කඩ, සඳකඩ පහණ හා මුරගල් ආදිය සඳහාත් බෙහෙවින් යොදා ගැණුනි. මේ හැර මාළිගාවිල බුදු පිළිමය හා දඹේගොඩ බෝසත් පිළිමය වැනි පසුකාලීන අති විශාල ප්‍රතිමා සඳහා ද එම පාෂාණය යොදා ගත්හ. බොහෝ සෙයින්ම පැරණි නිර්මාණ සඳහා සම්භාවිත පාෂාණ වර්ගය වූයේ ග්‍රැනයිට් ය. මේවා වියළි කලාපීය දේශගුණයට හොඳින් ඔරොත්තු දුන් අතර පහසුවෙන් ලබා ගැනීමට ද හැකි විය. කලාකෘති අතර වැඩි සැලකිල්ලට ලක්ව ඇති අභයගිරියේ හොඳම සඳකඩපහණ, මුරගල , ඉසුරුමුණි පෙම් යුවළ ආදිය ග්‍රැනයිට් වලින් නිමවා ඇත. නයිස් පාෂාණය අනුරාධපුර යුගයේ අවසාන භාගයේ සිට පොළොන්නරු යුගය පුරාම පාහේ විවිධ කටයුතු සඳහා බහුලව යෙදෙන්නට විය. පොළොන්නරු ශිව දේවාල, ගල්විහාර සංකීර්ණය මෙම පාෂාණ විශේෂයෙන් නිර්මාණය වී ඇත. මේවායේ ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ ලීයක මෙන් වෛරම් දක්නට ලැබීමයි.

මේ හැරුණු විට ඉතා විරල වශයෙන් හිරිගල් (කොරල්) වලින් කරන ලද ප්‍රතිමා සහ සැරසිලි ද අපට හමුවේ. ප්‍රදේශ කීපයකින් ගෙනෙන ලද මෙබඳු නිර්මාණ කිපයක් කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට තිබේ. මේ අතර පොළොන්නරුවෙන් සොයා ගත් මූර්ති කීපයක්ම වේ.පොළොන්නරුවේ ගල් විහාරයෙන් 1917 දී මධ්‍යම ප්‍රමාණයේ බුද්ධ ප්‍රතිමාවක ශිර්ෂයක් සොයා ගෙන ඇත. එහි මුහුණ එක්තරා ප්‍රමාණයකට බාදනයට ලක්ව ඇත. එසේම 1909 දී පමණ පොළොන්නරුවේ මැණික් වෙහෙරින් ද කීර්ති මුඛයකට සම්බන්ධ සැරසිලි තීරුවකින් වට වූ කවයක

මිනිස් මුහුණක් සහිත කැටයමක් සොයා ගෙන ඇත.[11] සියුම්ව සැරසිලි ගැන්වූ මෙම කැටයම් තීරුව මධ්‍යයේ ඇති ඉහත සඳහන් රූපය මකර තොරණ යට සිටින බෝසත් රුවක් යැයි පී. එච්. ඩී. එච්. සිල්වා මහතා විසින් හඳුන්වා දී ඇත.[12] මේ හැර එතරම් විශාල නොවූ අර්ධ උන්නත විෂ්ණු රූපයක් ද පොළොන්නරුවෙන් සොයා ගන්නා ලදුව කොළඹ කෞතුකාගාරයෙහි තැන්පත්ව ඇත. එසේම කුඩා ප්‍රමාණයේ වෙනත් කැටයම් පුවරු කීපයක් ද එහි වේ.[13] අනුරපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ද හිරිලින් නිම් භාණ්ඩ කීපයක් ඇත. ඩී. ටී. දේවේන්ද්‍ර මහතා සඳහන් කරන පරිදි ඩෙල්ෆ්ට් (නයිනතිව්) දූපතේ කුඩා බෞද්ධ ස්තූපයක් සැකසීමට ද භාවිතා කොට ඇත්තේ හිරිගල්ය.[14] මේ හැර කන්තරොදයෙන් හිරිගලින් කළ සිරිපතුල් ගලක්ද හමුවී ඇත.

හිරිගල් පාෂාණ නිර්මාණය වී පවත්නේ මුහුදු ආශ්‍රිත ප්‍රදේශ වලය. කෙසේ වුවත් විශාල ප්‍රතිමා නිර්මාණය කළ හැකි හිරිගල් පර්වත තිබුන ද ඒවායේ අභ්‍යන්තරය හොඳින් එකට බැඳී නොපවතියි. එසේ කැබලි වශයෙන් පවත්නා බැවින් විශාල කලා නිර්මාණයක් කළ නො හැකිය. කෙසේ වුවත් සාමාන්‍ය ප්‍රමාණයේ කලා කෘතියක් සඳහා මෙම පාෂාණ භාවිත කළ හැකිය. මේවා මෘදු පාෂාණ විශේෂයක් වන බැවින් ශිල්පීහු ඒවාට කැමත්තක් දැක්වීමට පුළුවන. නමුදු සුළු අතපසු වීමකින් වුවද කැඩී යා හැකි බැවින් ශිල්පියා ඉතා ඉවසිලිමත් විය යුතුය. කෙසේ වුවත් කොරල් නිර්මාන පරිසරයට එතරම් ඔරොත්තු නො දෙන අතර ඉතා සුළු ගින්නකින් වුවද එබඳු කලා කෘතියක් අළු බවට පත්වීමට ඇති ඉඩ කඩ වැඩිය.

දැනට ලංකාවේ ඇති කෞතුකාගාර අතුරින් වව්නියාවේ පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි දුර්ලභ මෙන්ම කලාත්මක ගිරිගල් මූර්ති කීපයක් දක්නා ලැබේ. මේවා මන්නාරමෙහි කිසියම් ආරාම භූමියක තිබී ගෙනවිත් ප්‍රදර්ශනයට තබා ඇත. ආයත චතුරශ්‍රාකාරව පිළියෙල කළ කොරල් ගල් කුට්ටිවල ඉදිරි මුහුණතක සැරසිලි මූර්තිමත් කොට ඇත. ප්‍රදර්ශිත මෙම කැටයම් අතර හංස රූප කීපයක් හා ඉරියව් දෙකින් යුතු කාන්තා රූප දෙකක් ද වේ.

ඉහත සඳහන් කළ හංසරූප වර්ග දෙකක් ඇත. සෙ. මී. 20ක් දිග සෙ. මී.11ක් පළල එක් ගල් පුවරුවක මුහුණතෙහි ඉදිරියට ගමන් කරන හංස රුවකි. පිරුණු ශරීරයකින් යුක්ත හංසයාගේ ගෙලට පහළින් දේහයේ ඉදිරි කොටස හොඳින් මතුකොට මඳක් ඉදිරියට නෙරනසේ සැකසිනි. කවීන් විසින් කාන්තාවන්ගේ පුන් පියයුරු වලට සමාන කොට ඇත්තේ විශේෂයෙන් ම හංසයින්ගේ ඉහත කී ශරීර අංගයයි. මෙම තිසර රුවෙහි බඳ මත ඇති පියාපත් හා පසුපස පෙඳ පිහාටු මැනවින් මූර්තිමත් කොට ඇත. පාද පිහිටුවා තිබූ අයුරු දැන ගැනීමට නොහැකිවන සේ සාධක ඉතිරි නොකොට රුවෙහි යට පාර්ශ්වය විනාශ වී ගොසිනි. (1 ඡායාරූපය බලන්න)

පෙර සඳහන් කළ අනෙක් හංස රුව සහිත හිරිගල් කුට්ටියේ දිග පළල පිළිවෙළින් සෙ. 19 x 13 කි. මෙම හංසයාගේ ශාරීරික ලක්ෂණ ඉහත රුවට සෑම අතින් ම සමාන වන අතර ඉරියව් වෙහි වෙනසක් දක්නා ලැබේ. එනම් හංසයා ඉදිරියට ගමන් කරමින් හිස ආපස්සට හැරී බලමින් සිටී. මෙහි මතුකළ පාදයේ කොටසක් පැහැදිළිව දැකගත හැකි වන පරිදි සුරැකී ඇති අතර එයින් වේගවත් ගමන් විලාශයක් ප්‍රකට කරයි. නමුදු තිසරාගේ පතුල සහ ඇඟිලි තුඩු ආරක්ෂා වී නොමැත. ඉහත විස්තර කළ ඉරියව් දෙකින් ම යුතු හංස රූප අනුරපුර හා පොළොන්නරුව සඳකඩ පහණ් වල සැරසිලි තීරු අතර පහසුවෙන් දැක ගත හැකිවේ. එහෙත් ඒවා කොරල් ගලින් කරන ලද ඒවා නොවේ. කොළඹ කෞතුකාගාරයෙහි මෙයට සෑම අතින්ම සමාන කොරල්ගල් කුට්ටි දෙකක නෙලන ලද දෙවනුව විස්තර කළ වර්ගයට අයත් හංස රූප 3 ක් දක්නට ලැබේ. මෙයින් එක් ගල් කුට්ටියක මුහුණත් දෙකක ආපසු හැරී මුවට තබා ගත් තිසරුන් දෙදෙනෙකි. අනෙක් පුවරුවෙහි හංසයා නෙළුම් හෝ මහනෙල් මල් පඳුරකින් ආපසු හැරී තුඩින් මලක් ඩැහැගැනීමට මෙන්. සිටී.[15] ඉහත සඳහන් කළ වව්නියා කෞතුකාගාරයේ තැන්පත් කළ හංස රූප නිර්මාණය සඳහා භාවිත කොරල් ගල්වල ඇති ඊට ආවේනික ශ්වේත වර්ණය එම රූප වලට මනා කලාත්මක ගුණයක් ලබා දීමට සමත් ව ඇත.

ඉහතින් සඳහන් කළ කාන්තා රූප දෙකද වෙන් වෙන් ව හිරිගල් කුට්ටි දෙකක අර්ධ උන්නතව මූර්තිමත් කොට ඇත. මෙයින් එක් කාන්තා රුවක් වේග රිද්මයකින් යුත් නර්තනයක යෙදන විලාශයක් දක්වයි. පිළිවෙළින් දිග සෙ. මී. 22 x 16 ක් වන ගල්පුවරුව මුහුණතෙහි ඇති මෙම කතගේ මුහුණ, පියයුරු, හා අත් වල දළ හැඩය පමණක් ඉතිරි කොට මතුපිට අංග වියැකී ගොසිනි. එබැවින් ප්‍රතිමාවේ මූලික අලංකාරයට සැළකිය යුතු තරම් හානි පැමිණ ඇත. එසේ වුවද කාන්තා සිරුරෙහි අංග ලක්ෂණ පිහිටුවා ඇති අයුරින් එහි කලාත්මක ගුණය විමසිලිමත්ව බලන්නෙකුට නොඅඩුව දැකගත හැකිය. (2 ඡායාරූපය බලන්න)

ඇය ඉදිරියට හැරී මුහුණු වම්පසට හරවා මඳක් ඉහළට යොමුකර සිටින්නීය. මෙම කතගේ හිසෙයි වූ මඳක් විශාල කෙස් වැටිය වේගවත් නර්තනයට උචිත පරිදි විසිර නොයෙන සේ කේතුකාරව ගැට ගැන්වූ බවක් පෙනී යයි. වාම හස්තය වැලමිට ලඟින් නමා ලැම ඉදිරියට ගත් ඡායාමාත්‍රයක් දක්නට ලැබුණ ද එය කවර මුද්‍රාවකින් යුතුව පිහිටුවන ලද්දේ දැයි කිව නොහැකි අයුරින් ගෙවී ගොසිනි. ඇගේ දකුණු අත පිටට විහිදුවා මඳක් ඉහළට ඔසවා සිටී. මෙම නර්තන ශිල්පිණියගේ පියයුරුවල ඉතිරිව ඇත්තේ දළ හැඩය පමණක් වන අතර ඉහටිය එතරම් සිහින් බවක් දක්නට නැත. දෙපාවල ඌරු දෙපසට විහිදුවා මුළු සිරුරෙහි බර දණ හිස ලඟින් නමාගත් ජංගා වලට ගනිමින් ඇය ඉතා උද්වේගකර නර්තනයක යෙදෙමින් සිටින්නීය. දර්ශන මාත්‍රයට අනුව ඇය භේරීනාද තාල අනුකරණයට නර්තනයෙහි යෙදෙන බවක් හැඟී යයි.

ඇයගේ කර්ණාභරණය හැර වෙනත් කිසිදු ආභරණයක් හඳුනා ගැනීමට හැකි වන සේ ඉතිරි වී නොමැත. යටිකය දුහුල් වස්ත්‍රයකින් වසා සිටින බවක් හැඟී යන අතර වඩාත් පහතට නැමී ගිය පාද මූලය ආසන්නයෙන් ඇදීගිය රෙදිපටක් දක්නා ලැබේ. ඒ අනුව යටිකය පැළඳුම් වස්ත්‍රය ධෝතියකට සමාන එකක් බව අනුමාන කළ හැකිවේ. ඇයගේ දකුණු උරහිස ආසන්නයෙන් ද එබඳුම දුහුල් රෙදිපටක සළකුණු දක්නා ලැබේ. මේ අනුව ඇය සළු නැටුමක් රඟ දක්වනවා වීමට පුළුවන. මෙයට සමාන නර්තන විලාශයන් දක්වන ග්‍රැනයිට් පාෂාණයෙන් කළ මූර්ති තීරුවක් අනුරපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි අංක 4 යි. ප්‍රදර්ශනයට තබා තිබේ. එසේම රිද්මය අතින් වචිනියා කෞතුකාගාරයේ කාන්තා රුවට මදක් සමාන නර්තන ශිල්පිනියක් සහිත කැටයම් තීරුවක් පොළොන්නරු ශිව දේවාලයෙන් සොයා ගන්නා ලදුව කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.[16]. එහෙත් මෙම කැටයම් වල ඉහත කාන්තාවගේ ඇති උද්වේගකර නර්තන විලාශය දක්නට නැත.

හිරිගලින් නිර්මිත අනෙක් කාන්තා රූපය හිටිවන ඉරියව්වෙන් සිටින්නියකි. බෙහෙවින් උන්නතව නෙලන ලද ඇගේ හිස, දකුණු බාහුව හා පාදාන්තය විනාශ වී ගොසිනි. ඉතිරි වී ඇති කොටසෙහි උස සෙ. මී. 17 කි. කාන්තා සිරුරෙහි මතුපිට අංගප්‍රත්‍යංග ද තරමක් දුරට වියැකී පවතී. නාරිදේහ ලක්‍ෂණ මැනවින් මතුවන පරිදි මනා ප්‍රාගුණ්‍යයකින් යුතු නිර්මාණ ශිල්පියෙකු විසින් එය කරන ලද බව පැහැදිළිය. කාන්තාවන්ගේ එතරම් පළල් නොවූ ලැම මත පියයුරු මදක් විශාලව නිම වූ බවට සාධක ශේෂව පවතී. ඉහටිය සෙ. මී. 2.5 ක් පමණ සිහින්ව නිමවා උකුල සෙ. මී. 4.5 ක් තරම් පළල්ව සැකසිනි. වම් පාදය මදක් ඉදිරියට තබා දකුණු පාදයට බරදී සිටගත් ඇයගේ වම් අත පිරුණු වම් උකුල මත රඳවා සිටී. කිසිදු බර කිරීමකින් තොරව තබාගත් මෙම අතෙහි ඇඟිලි සියල්ල පැහැදිළිව දක්නා ලැබේ. මෙම ඇඟිලි පිහිටුවීමේ ක්‍රමය අනුව කලාකරුවා තුළ පැවති ස්භාවිකත්වය හා කලාත්මක බව නිර්මාණ ශිලීව ගැලපීමේ හැකියාව මොනවට ප්‍රකට කෙරෙන නිදසුනකි. (3 ඡායාරූපය බලන්න)

සිහින් බඳ මත මදක් දිගටි හැඩයෙන් දැක්වූ පෙකණියට පහතින් යටිකය වැසූ වස්ත්‍රය දක්නා ලැබේ. ඇඟ දැවටූ මෙම දුහුල් ධෝතිය තරකළ ඉහ බන්ධනයක් යොදා ඇති අතර ඉන් තෙරපුනු ඇගේ මෘදු මස්පිඩු එම බන්ධයෙන් මදක් පිටතට නෙරා සිටී. මේ හැර වම් ඉහටියේ සිට දකුණු ඉහටිය දක්වා පහළට බරව චක්‍රාකාරව දෙකලවා හරහා ඇදී ගිය සළු පටවල් කීපයකි. ඒවා ඉහටිය දෙපස ගැටගැන්වීමෙන් අලංකාර ලෙස පහතට ඇදීයයි. දෙකලවා මැදින් ද සළුපට තුනක් පැහැදිළිව නිරූපණය වී ඇත. මෙම යටිකය පිළන්දන වල විවිධ සැරසිලි යෙදූ බවට ඡායා සලකුණු තිබුණද ඒවා හොඳින් හඳුනා ගැනීම දුෂ්කරය. කාන්තා රුවෙහි

වම් අතෙහි ඉහළ සහ පහළ බාහුමත වළළු වලින් අලංකෘතය. ඒවායේ ද සියුම් ලක්‍ෂණ වියැකී ගොසිනි. මෙම රුවෙහි වාම අංශයෙන් තවත් සැරසිලි මූර්ති කොටසක් දක්නට ලැබුණද එහි ස්වරූපය හඳුනාගත නොහැකි අයුරින් එම කොටස කැඩී ගොසිනි.

මෙම මූර්තියෙන් නිරූපනය වන්නේ බොහෝවිට රාජකීය කාන්තාවක් විය හැකි අතර ඇයට ආවේනික ධීශක්තියෙන් යුතුව ඉදිරිය බලා සිටිනවා විය යුතුය. මෙම කාන්තා රූපයට බෙහෙවින් සමාන මදක් විශාල ඩොලමයිට් පාෂාණයෙන් කළ කාන්තා රූපයක් මින්නේරිය වැව් බැම්ම මතින් සොයා ගෙන ඇත.(17) එය යක්‍ෂ හෝ නාගිනී රුවක් විය හැකිය.

මෙයටම තවත් සමාන කම් ඇති කාන්තා රූප කීපයක්ම සොයා ගෙන ඇත. මින් එකක් මිහින්තලයෙන් හමුවන ලදුව දැනට අනුරපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ අංක 4 මැදිරියේ තැන්පත්ව ඇත. ඇය අත් දෙකම ඉහටියට තබා සිටින අතර හිස සුන්ය.(18)

එසේම ජේතවන කැනීම්වලින් සාමාන්‍ය පුරුෂ ප්‍රමාණයේ කාන්තා රූප දෙකක් සොයා ගෙන ඇත. ඉන් එකක හිස නොමැත. ප්‍රතිමා දෙකෙහිම දෙ අත් සිඳී ගොසිනි. දේහයේ නිර්මාන ලක්‍ෂණ වව්නියා හිරිගල් කාන්තාවට සමාන වේ.(19) මෙම රූප සියල්ලම නාගිනී හෝ යක්‍ෂණී රූපයයි. අනුමාන කොට ඇති අතර ක්‍රි. ව. 4-5 සියවස් අතරට කාලනිර්ණය කර තිබේ. (20) මේ අනුව ඉහත කාන්තා රූපය ද ඇතැම් විටක රාජකීය කතක් හෝ යක්‍ෂණී රූපයක් වීමට ඉඩකඩ ඇති අතර ඒවා ද ඉහත නිර්මාණවලට ආසන්න පසුකාලීන මූර්ති වීමට පුළුවන.

මන්නාරමෙන් සොයා ගත් මෙම හිරිගල් සැරසිලි මූර්ති සහිත කොටස් එකිනෙකට මාරුවෙන් මාරුවට තබමින් කිසියම් කොටසක් අලංකාරය සඳහා යෙදෙන්නට ඇත. උගතුන් විසින් මෙතෙක් එතරම් අවධානයක් යොමු කොට නොමැති මෙම හිරිගල් මූර්ති කෙරෙහි සැලකිල්ල දැක්විය යුතු අතර ඉතා ඉක්මනින් විනාශයට ලක්වන මේවා සංරක්‍ෂණය සඳහා ද වඩා උනන්දු විය යුතුය.


(මෙම මූර්ති අධ්‍යයනය සඳහා වව්නියාවට යාම සඳහා ගමන් පහසුව සලසා දුන් අභයගිරි විහාර ව්‍යාපෘතියේ ප්‍රධාන කැනීම් පරීක්‍ෂක ජයන්ත රත්නායක මහත්මාට ද වව්නියාව කෞතුකාගාරයෙහි සේවක මහතුන්ට ද අතිශය කෘතඥ වෙමි.)

# පාදක සටහන්


1. Devendra, D. T., Classical Scculptures (CSS), 1958, London, PP. 7 - 8
2. Schroeder, Ulrich von., Buddhist Sculptures of Sir Lanka (BS) 1990, Hongkong, Plate 107, A. B. C. D.
3. Ibid, P. 314-323, Plate 89-93
4. Ibid,P.400 Plate 92 A. B. C. D. G.H.
5. Ibid, Plate 93 A.B.
6. Dissanayake, J. B., Mihintale, 1987, Colombo, P. 28
7. BS. P. P. 388 -395, plate `115 -118
8. Ibid, P. 277
9. Ibid, P. 208
10. Ibid, p. 170
11. Ibid, p.400 Plate 121 A.B.
12. Silva P. H. D. H. Colombo Natioal Museum Illustrated Guide (CNMIG), 1976, P.84
13. Ibid, P. P. 48 - 49, Plate 35,36,41
14. CSS., P.8
15. CNMIG., P.48, Plate 36,41
16. Ibid, P.93, Plate162
17. BS., P.244, Plate 162
18. BS., p. 244, Plate 57E
19. Ibid, P.247, Plate 58 E, F
20. Ibid, P.246



1 ඡායාරූපය



2 ඡායාරූපය



3 ඡායාරූපය